# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන පනත

---

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 2 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**1981 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

**මිළ : රු. 1.20 යි** **තැපැල් ගාස්තුව : ශත 75 යි**

## 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 2 වන දින]

**එල්. ඩී.—ඕ. 42/80.**

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය.**

1. මේ පනත 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි “ නියමිත දිනය ” යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනය පිහිටුවීම.**

2. ජලජ සම්පත් පිළිබඳ විෂයය සම්බන්ධයෙන් පර්යේෂණ, සංවර්ධන හා කළමනාකරණ කටයුතු කරගෙනයාමේ හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම භාර ප්‍රධාන ජාතික ආයතනය විය යුතු වූ (මෙහි මින් මතු “ නියෝජ්‍යායතනය ” යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනය, මේ පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවනු ලැබේ.

**නියෝජ්‍යායතනය සංස්ථාවක් විය යුතු බව.**

3. නියෝජ්‍යායතනය 2 වන වගන්තියෙන් ඊට පවරන ලද නමින් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර එම සංස්ථාවේ නමින් නියෝජ්‍යායතනය විසින් ද නියෝජ්‍යායතනයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

**නියෝජ්‍යායතනයේ අරමුණු හා කර්තව්‍ය.**

4. නියෝජ්‍යායතනයේ අරමුණු හා කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) ජලජ සම්පත් පිළිබඳ විෂයය සම්බන්ධයෙන් ජාතික සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික විශේෂඥතාව යොදා ගැනීම හා උපයෝගී කර ගැනීම සහතික කිරීම ;

(ආ) ජලජ සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම අරභයා යොමු කරන ලද, එමෙන්ම විශේෂයෙන් ම පහත දැක්වෙන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වූ පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම හා කරගෙන යාම :—

(i) සාගර විද්‍යාව ;

(ii) ධීවර යාත්‍රාව, මසුන් ඇල්ලීමේ ආම්පන්න හා උපකරණ සහ මසුන් ඇල්ලීමේ ක්‍රම දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම ;

(iii) ධීවරයන්ගේ සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ සුභ සාධනය ඇතුළුව ධීවර කර්මාන්තයේ සමාජීය හා ආර්ථික අංග ;

2—ජී 57701—12,875 (81/07)

(iv) මාළු මෙන්ම සම්බන්ධිත නිෂ්පාදිතයන් ද පිරි සැකසුම් කිරීම, පරීක්ෂණය කිරීම හා අලෙවි කිරීම ;

(v) අභ්‍යන්තර ජල ප්‍රදේශවල, වෙරළබඩ තෙත් බිම්වල හා අක්වෙරළ ප්‍රදේශවල ජලජ සම්පත් සංවර්ධනය කිරීම, කළමනාකරණය කිරීම හා සංරක්ෂණය කිරීම ;

(ඇ) ජලජ සම්පත් ප්‍රයෝජනයට ගැනීම, කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳ විද්‍යාත්මක, තාක්ෂණික හා නෛතික කරුණු සම්බන්ධයෙන් උපදේශක හා අනුශාසක සේවා සැපයීම ;

(ඈ) ජලජ සම්පත් ප්‍රයෝජනයට ගැනීමෙහි, සැලසුම් කිරීමෙහි, ඒවා පිළිබඳව පර්යේෂණ පැවැත්වීමෙහි, ඒවා සංවර්ධනය කිරීමෙහි, පාලනය කිරීමෙහි හා කළමනාකරණය කිරීමෙහි නියැලුණු ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් හා ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු හා දත්ත එකතු කිරීම, ව්‍යාප්ත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම භාර ගැනීම ;

(ඊ) නියෝජ්‍යායතනයේ වැඩ කරගෙන යාමට හෝ ඊට සහාය වීමට අවශ්‍ය තැනැත්තන්ට පුහුණුව ලබා දීම ; සහ

(උ) මේ පනත යටතේ නියෝජ්‍යායතනය වෙත පවරන ලද හෝ නියම කරන ලද සියලු බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

නියෝජ්‍යායතනය සතු බලතල හා කාර්ය.

5. නියෝජ්‍යායතනයට පහත දැක්වෙන කටයුතු කිරීමට බලය ඇත්තේ ය—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර වූ හෝ ආකාරයකින් අත්කර ගැනීම සහ තබා ගැනීම සහ එවැනි යම් දේපළක් විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම :

(ආ) නියෝජ්‍යායතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නියෝජ්‍යායතනය විසින් අවශ්‍යයයි සලකනු ලබන කාර්යාල, ගොඩනැගිලි, ස්ථාපන, රසායනාගාර, යන්ත්‍රාගාර, උපකරණ, වාහන, යාත්‍රා හා වෙනත් යාත්‍රා වැනි පහසුකම් පිහිටුවීම හා පවත්වාගෙන යාම ;

(ඇ) ජලජ සම්පත් වාණිජමය වශයෙන් උපයෝගී කර ගැනීම හා සංවර්ධනය කිරීම සහ ඒ පිළිබඳ විශේෂඥතාව යොදා ගැනීම හා උපයෝගී කර ගැනීම සඳහා නියෝජ්‍යායතනය විසින් අවශ්‍ය යයි සලකනු ලබන ව්‍යාප්ත සේවා ඇතුළුව කටයුතු හා මෙහෙයුම් භාර ගැනීම ;

(ඇ) එහි කර්තව්‍ය කරගෙන යාමේ කාර්යය සඳහා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා සහ වෙනත් තැනැත්තන් සමග යම් ගිවිසුමකට හෝ එකඟවීමකට ඇතුළත් වීම ;

(ඉ) එහි අරමුණු අතරින් යම් අරමුණක් ඉටු කිරීමේ කාර්යය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන නියම හා කොන්දේසි මත ණය ලබා ගැනීම ;

(ඊ) නියෝජ්‍යායතනය විසින් සපයනු ලබන යම් සේවා හෝ පහසුකම් සඳහා ගාස්තු අය කිරීම ;

(උ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, පුහුණු කිරීම සඳහා වූ පිරිනැමීම් ඇතුළුව විදේශීය හෝ දේශීය පරිත්‍යාග හා ප්‍රදාන භාර ගැනීම සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, ඉගැනවීම හා පුහුණු කිරීම සඳහා ප්‍රදාන ලබා දීම ;

(ඌ) පේටන්ට් බලපත්‍ර, කාර්මික මෝස්තර, ප්‍රකාශන අයිතිය සහ වෙළෙඳ ලකුණු පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට ඇතුළත් වීම ;

(එ) (i) ධීවර කර්මාන්තය පිළිබඳ විෂයය තත් කාලීනව පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජාතික සංවර්ධන නියමාවලිය ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අරමුණ ඇතිව ඒ අමාත්‍යාංශය උදෙසා ; සහ

(ii) වෙනත් යම් අමාත්‍යාංශයක, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ එහි යම් ශාඛාවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ ඉල්ලීම පරිදි නියෝජ්‍යායතනය විසින් අමාත්‍යවරයාගේ අදහස් විමසා ප්‍රඥාගෝචර යයි සලකනු ලබන ආකාරයකින්

පර්යේෂණ හා කාර්මික සේවා පවත්වාගෙන යාම හා ලබා දීම ;

(ඒ) (i) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් පර්යේෂණය, කළමනාකරණය, සංවර්ධනය සහ ඒවා සංරක්ෂණය කිරීම හා උපයෝගී කර ගැනීම ඇතුළුව ඛිඩිමත් කිරීම සම්බන්ධයෙන් ; සහ

(ii) ශ්‍රී ලංකාවේ ජාතික ජලජ සම්පත් කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධයෙන්

යම් අමාත්‍යාංශයකට, ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට හෝ ඒවායේ යම් ශාඛාවකට, යම් රාජ්‍ය සංස්ථාවකට හෝ වෙනත් යම් තැනැත්තකුට උපදෙස් දීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම ;

3—ඒ 57701 (81/07)

(ඞ) ජලජ සම්පත් කළමනාකරණ, සංවර්ධන හා පර්යේෂණ සැලැස්මක් පිළියෙල කිරීම සහ ඒ සැලැස්ම කලින් කල ප්‍රතිශෝධනය කිරීම ;

(ඹ) ශ්‍රී ලංකාවේ ජාතික ජලජ සම්පත් හා අක් වෙරළ ප්‍රදේශ පිළිබඳ සමීක්ෂණ ආරම්භ කිරීම හා ඒවා පවත්වාගෙන යාම ;

(ක) අමාත්‍යවරයා විසින්, අමාත්‍යාංශයේ ජාතික සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විමසා නියෝජ්‍යායතනය වෙත පවරනු ලබන යෝජනා ක්‍රම හා කර්තව්‍ය සියල්ල භාර ගැනීම හා ඉටු කිරීම ; සහ

(ග) එකී අරමුණු හා කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම හා ඉටු කිරීම සඳහා අවශ්‍යවන සියලු ක්‍රියාමාර්ග ගැනීම.

පාලක මණ්ඩල යෙහි සංයුතිය.

6. (1) නියෝජ්‍යායතනයේ බලතල හා කාර්ය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු " මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් වෙත සතු කළ යුතු ය :—

(අ) එක් එක් සාමාජිකයා ජලජ සම්පත් කළමනාකරණ, පර්යේෂණ හෝ සංවර්ධන ක්ෂේත්‍රයෙහි සම්භාවිත වන්නා වූ ද (මෙහි මින් මතු " පත් කළ සාමාජිකයන් " යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද සාමාජිකයන් අට දෙනකු ; සහ

(ආ) නිල බලයෙන් පත් වන පහත දැක්වෙන සාමාජිකයන් :—

(i) ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා ;

(ii) කර්මාන්ත හා විද්‍යා කටයුතු විෂයය භාර අමාත්‍යවරයා ගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා හෝ ඒ අමාත්‍ය වරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයා ;

(iii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයා ; සහ

(iv) නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා.

(2) සෑම පත් කළ සාමාජිකයකු ම, මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා තම ධුරය කලින් හිස් කරනහොත් මිස, අවුරුදු දෙකක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු නැවතත් පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(3) යම් පත් කළ සාමාජිකයකු, තම ධුර කාලය අවසන් වීමට පෙර ධුරය හිස් කරනු ලබන අවස්ථාවක, තමා අනුප්‍රාප්තික වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ධුරය දැරීම සඳහා අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

7. (1) මණ්ඩලය විසින්, මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව— මණ්ඩලයේ බල තල හා කාර්ය.

(අ) නියෝජ්‍යායතනයේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා එහි ප්‍රතිපත්ති සකස් කිරීම ;

(ආ) නියෝජ්‍යායතනයේ කර්තව්‍ය අතුරෙන් කවර වූ හෝ කර්තව්‍ය ඉටු කිරීම ;

(ඇ) නියෝජ්‍යායතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය වනු ලබන නියෝජ්‍යායතනයේ දෙපාර්තමේන්තු හා අංශ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පිහිටුවීම ;

(ඈ) නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, පහ කිරීම, එහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ වේතන හා පඩි නඩි නියම කිරීම ;

(ඉ) ඒ කාර්ය මණ්ඩලයේ සේවය පිළිබඳ නියම හා කොන්දේසි තීරණය කිරීම ;

(ඊ) කාර්ය මණ්ඩලයේ හා ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ යහපත සඳහා අර්ථ සාධක අරමුදලක් හා ශුභ සාධක යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම ;

(උ) නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සියලු කරුණු හෝ ඒවා අතුරෙන් යම් කරුණක් සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

8. (1) මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් අතුරෙන් අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සභාපතිවරයා.

(2) සභාපතිවරයා, සභාපතිවරයා වශයෙන් තම ධුරය කලින් හිස් කළහොත් මිස, අවුරුදු දෙකක කාලයක් ධුරය දැරිය යුතු නමුදු, ඔහු එම ධුරය සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය :

එසේ වුවද, සභාපතිවරයා, තම ධුර කාලය අවසන් වීමට පෙර සභාපතිවරයා වශයෙන් ධුරය දැරීම අවසන් කරන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් වෙනත් පත් කළ සාමාජිකයකු සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය හැකි අතර ඒ අනුප්‍රාප්තිකයා, සභාපතිවරයා වශයෙන් තම ධුරය කලින් හිස් කළහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සභාපතිවරයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ඔහු සභාපතිවරයා වශයෙන් සේවය කළ යුතු ය.

(3) රෝගාතුර වීම නිසා, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මණ්ඩලයේ සභාපතිවරයාට තාවකාලිකව ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට නොහැකි වෙතොත් ඔහු වෙනුවට වැඩ බැලීමට යම් පත් කළ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(4) අමාත්‍යවරයා වෙත තම අත්සනින් යුත් ලිපියක් යැවීමෙන් සභාපතිවරයාට සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**9.** (1) අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ නිර්දේශය මත, (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝජ්‍යායතනයේ වැඩ සම්බන්ධයෙන් සුදුසුකම් ලත් තැනැත්තකු නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයාට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් හා අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා, මණ්ඩලයේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන සේවය පිළිබඳ නියම හා කොන්දේසි වලට යටත් විය යුතු ය.

(3) මණ්ඩලයේ පරිපාලන කර්තව්‍ය ඉටු කිරීම සහ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු ය.

(4) මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලබන මණ්ඩලයේ බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාට භාර විය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, පත් කරන ලද සාමාජිකයන්ගෙන් මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන බව සලකනු ලැබිය යුතු ය.

**10.** (1) මණ්ඩලය යටත් පිරිසෙයින් මසකට වරක් රැස්විය යුතු ය.

(2) මණ්ඩලයේ විශේෂ රැස්වීමක් නොවන සෑම රැස්වීමක් සම්බන්ධයෙන් ම යටත් පිරිසෙයින් ලියවිල්ලකින් වූ දින හතක දැනුම්දීමක් සභාපතිවරයා විසින් සාමාජිකයන් අතුරෙන් එක් එක් සාමාජිකයා වෙත දිය යුතු අතර ඒ රැස්වීමේ දී කරනු ලබන කටයුතු ඒ දැනුම්දීමෙහි නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් හතර දෙනකු මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවන ලෙස ලියවිල්ලකින් ඉල්ලා සිටිනු ලැබීමෙන් පසු, දින හතක් ඇතුළත, සභාපතිවරයා විසින් එසේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ ඒ විශේෂ රැස්වීම සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් ලියවිල්ලකින් වූ දින දෙකක දැනුම්දීමක් සභාපතිවරයා විසින් සාමාජිකයන් අතුරෙන් එක් එක් සාමාජිකයා වෙත දිය යුතු අතර ඒ රැස්වීමේ දී කරනු ලබන කටයුතු ඒ දැනුම්දීමෙහි නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(5) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(6) මණ්ඩලයේ සියලු තීරණ, හැකි තරම් දුරට සම්මතියක් මගින් ගනු ලැබිය යුතු ය.

(7) සම්මතියකට එළඹිය නොහැකි වන අවස්ථාවක, ඒ පිළිබඳව තීරණයක් ගැනීම මණ්ඩලයේ ඊළඟ රැස්වීම සඳහා කල් දමනු ලැබිය යුතු ය. ඒ රැස්වීමේ දී එවැනි සම්මතියකට එළඹිය නොහැකි වන අවස්ථාවක, ඒ පිළිබඳව ඡන්දයක් විමසනු ලැබිය යුතු අතර බහුතර ඡන්දයක් මගින් තීරණයක් ගනු ලැබිය යුතු ය. ඡන්ද පිළිබඳ සමානතාවක් ඇති වූ අවස්ථාවක, සභාපතිවරයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(8) මණ්ඩලයේ සෑම රැස්වීමක ම රැස්වීම් කටයුතු වාර්තා පොතක සටහන් කරනු ලැබිය යුතු අතර ඒ වාර්තාව මණ්ඩලයේ ඊළඟ රැස්වීමේ දී ස්ථිර කරනු ලැබිය යුතු ය.

(9) මණ්ඩලය විසින්, මෙහි ඇතුළත් විධිවිධානවලට යටත්ව, ස්වකීය කාර්ය පරිපාටිය තීරණය කරනු ලැබිය හැකි ය.

11. මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සේවානියුක්තිය පිළිබඳ නියම හා කොන්දේසි මත මණ්ඩලය විසින් පත් කරනු ලබන්නාවූ ද, මණ්ඩලයේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් වන්නා වූ ද ලේකම්වරයකු මණ්ඩලයට සිටිය යුතු ය. මණ්ඩලයේ ලේකම්වරයා.

12. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානය හා පාලනය යටතේ තිබිය යුතු නියෝජ්‍යායතනයේ ලේකම් කාර්යාලයක් තිබිය යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඊට පවරනු ලබන පරිපාලන හා වෙනත් කර්තව්‍ය ඒ ලේකම් කාර්යාලය විසින් ඉටු කළ යුතු ය. නියෝජ්‍යායතනයේ ලේකම් කාර්යාලය.

13. (1) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික ජලජ සම්පත් කළමනාකරණ සභාවක් තිබිය යුතු ය. ජාතික ජලජ සම්පත් කළමනාකරණ සභාව.

(2) සභාව—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන් වන—

(i) එක් එක් තැනැත්තා ජලජ සම්පත් කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම හා සම්බන්ධිත ක්ෂේත්‍රයක පිළිගත් ප්‍රවීණතාවක් හෝ විශිෂ්ටතාවක් ලබා තිබිය යුතු නැතහොත් නියෝජ්‍යායතනයේ වැඩ පිළිබඳ යම් අංශයක් සම්බන්ධයෙන් අත්‍යාකාරයකින් විශේෂයෙන් සුදුසුකම් ලැබූ තැනැත්තන් හය දෙනකුගෙන් ;

(ii) සාගර නිෂ්පාදිත සැකසීම් හා අපනයන කර්මාන්තය පිළිබඳ නියෝජිතයකුගෙන් ;

(iii) මසුන් ඇල්ලීමේ යාත්‍රා සහ මසුන් ඇල්ලීමේ ආම්පන්න නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය පිළිබඳ නියෝජිතයකුගෙන් ; සහ

(iv) ජලජ සම්පත් හා සම්බන්ධිත ක්ෂේත්‍රයක ඉගැන්වීමෙහි හෝ පර්යේෂණයෙහි නිරත වූ උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් තැනැත්තකුගෙන් ද ;

(ආ) නිල බලයෙන් පත් වන පහත දැක්වෙන සාමාජිකයන් වන—

(i) පත් කරන ලද මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් ;

(ii) ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ;

(iii) අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ;

(iv) නියෝජ්‍යායතනයේ එක් එක් දෙපාර්තමේන්තුවල සහ අංශවල අධ්‍යක්ෂවරයන්ගෙන් ;

(v) පහත දැක්වෙන විෂයයන් භාර ධීවර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයන්ගෙන්—

(අ) ක්‍රම සම්පාදනය හා වැඩ පිළිවෙළවල් ;

(ආ) ව්‍යාප්තිය හා විධිමත් කිරීම ;

(ඇ) සංවර්ධනය ;

(ඈ) ධීවරයන්ගේ ශුභ සාධනය ;

(ඉ) දේශීය ධීවර කර්මාන්තය ;

(ඊ) වෙරළ සංරක්ෂණය ;

(vi) ලංකා ධීවර වරාය සංස්ථාවේ සභාපතිවරයාගෙන් ;

(vii) ලංකා ධීවර සංස්ථාවේ සභාපතිවරයාගෙන් ;

(viii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයාගෙන් ;

(ix) කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයාගෙන් ;

(x) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයාගෙන් ;

(xi) වාරිමාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයාගෙන් ;

(xii) නාවික කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයාගෙන් ;

(xiii) විදේශ කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයාගෙන් ;

(xiv) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයාගෙන් ;

(xv) වන සත්ව සංරක්ෂණය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයාගෙන් ද

සමන්විත විය යුතු ය.

(3) නිරීක්ෂකයන් වශයෙන් ස්වකීය රැස්වීම්වලට සහභාගි වීම සඳහා යෝග්‍ය යයි සභාව විසින් කල්පනා කරනු ලබන වෙනත් තැනැත්තන්ට සභාව විසින් ආරාධනය කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සභාවේ සෑම සාමාජිකයකු විසින් ම, මිය යාමේ, ඉල්ලා අස්වීමේ හෝ ඉවත් කරනු ලැබීමේ හේතුවෙන් ධුරය කලින් හිස් කළහොත් මිස, අවුරුදු දෙකක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු නැවතත් පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු සිය ධුර කාලය අවසන් වීමට පෙර ධුරය හිස් කරනු ලබන අවස්ථාවක, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ධුරය දැරීම සඳහා අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

14. සභාවේ බලතල හා කාර්ය— *සභාවේ බලතල හා කාර්ය.*

(අ) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් වූ කරුණු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම ; සහ

(ආ) සම්පත් කළමනාකරණ, සංවර්ධන හා පර්යේෂණ සැලසුම් පිළියෙළ කිරීම සහ අඛණ්ඩව සමාලෝචනය යටතේ තබා ගැනීම

විය යුතු ය.

15. (1) ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් සභාවේ සභාපතිවරයා විය යුතු ය. *සභාවේ සභාපතිවරයා.*

(2) සභාවේ සභාපතිවරයා සභාවේ සෑම රැස්වීමකම මූලසුන දැරිය යුතු අතර, සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි නම්, එම රැස්වීමට පැමිණ සිටින සභාවේ සාමාජිකයන් විසින්, ඒ රැස්වීමෙහි මූලසුන දැරීම සඳහා ඔවුන්ගෙන් කෙනකු තෝරා පත් කර ගත යුතු ය.

සභාවේ රැස්වීම් කටයුතු ආදිය.

**16.** (1) සභාපතිවරයා විසින් සෑම තුන් මසකට වරක් ම සභාවේ රැස්වීමක් කැඳවිය යුතු ය.

(2) සභාපතිවරයා විසින්, සාමාජිකයන් අතුරෙන් එක් එක් සාමාජිකයා වෙත යටත් පිරිසෙයින් දින දාහතරක දැනුම්දීමක් දිය යුතු අතර, ඒ රැස්වීමේ දී කරනු ලබන කටයුතු ඒ දැනුම්දීමෙහි නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(3) සභාවේ සාමාජිකයන් දහ දෙනකු සභාවේ විශේෂ රැස්වීමක් කැඳවන ලෙස ලියවිල්ලකින් ඉල්ලා සිටිනු ලැබීමෙන් පසු දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් එසේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(4) සභාවේ ඒ විශේෂ රැස්වීම සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් ලියවිල්ලකින් වූ දින දෙකක දැනුම්දීමක් සභාපතිවරයා විසින් සාමාජිකයන් අතුරෙන් එක් එක් සාමාජිකයා වෙත දිය යුතු අතර ඒ රැස්වීමේ දී කරනු ලබන කටයුතු ඒ දැනුම්දීමෙහි නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(5) සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දහ අට දෙනකු විය යුතු ය.

(6) සභාවේ සියලු තීරණ, හැකි තරම් දුරට සම්මතියක් මගින් ගනු ලැබිය යුතු ය.

(7) සම්මතියකට එළඹිය නොහැකි වන අවස්ථාවක, ඒ පිළිබඳව තීරණයක් ගැනීම සභාවේ ඊළඟ රැස්වීම සඳහා කල් දමනු ලැබිය හැකි ය. එවැනි රැස්වීමක දී එවැනි සම්මතියකට එළඹිය නොහැකි වන අවස්ථාවක, ඒ පිළිබඳව ඡන්දයක් විමසනු ලැබිය යුතු අතර බහුතර ඡන්දයක් මගින් තීරණයක් ගනු ලැබිය යුතුය. ඡන්ද පිළිබඳ සමානතාවක් ඇති වූ අවස්ථාවක සභාපතිවරයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(8) සභාවේ සෑම රැස්වීමකම රැස්වීම් කටයුතු වාර්තා පොතක සටහන් කරනු ලැබිය යුතු අතර ඒ වාර්තාව සභාවේ ඊළඟ රැස්වීමේ දී ස්ථිර කරනු ලැබිය යුතු ය.

(9) සභාව විසින්, මෙහි ඇතුළත් විධිවිධානවලට යටත්ව, ස්වකීය කාර්ය පරිපාටිය තීරණය කරනු ලැබිය හැකි ය.

විද්‍යාත්මක හා කාර්මික කමිටුව.

**17** (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) විද්‍යාත්මක හා කාර්මික කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන නියෝජ්‍යායතනයේ ස්ථාවර කමිටුව, පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සංස්ථාපිතය විය යුතු ය:—

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ආ) 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයන්; සහ

(ඇ) 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) සිට (ix) දක්වා වූ අනු ඡේද යටතේ ධුර දරන සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජිකයන්.

18. කමිටුවේ කාර්ය මෙසේ විය යුතු ය :— කමිටුවේ කාර්ය.

(අ) පර්යේෂණය හා සංවර්ධනය පිළිබඳව යෝජනා භාර ගැනීම සහ ඇගයීම සහ නියෝජ්‍යායතනයේ වාර්ෂික වැඩ තියමාවලිය හා අය වැය ලේඛනය සම්බන්ධයෙන් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම,

(ආ) කමිටුව වෙත ඉදිරිපත් කරන වාර්තා භාර ගැනීම හා ඇගයීම සහ අනුමත ව්‍යාපෘතීන් පිළිබඳ ප්‍රගතිය සමීක්ෂණය කිරීම සහ ඒ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම, සහ

(ඇ) අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය විසින් හෝ සභාව විසින් කමිටුව වෙත යොමු කරනු ලබන විද්‍යාත්මක හෝ කාර්මික කරුණු සම්බන්ධයෙන් උපදෙස් ඉදිරිපත් කිරීම.

19. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, යටත් පිරිසෙයින් සෑම දෙමසකට වරක් ම කමිටුවේ රැස්වීමක් කැඳවිය යුතු ය. කමිටුවේ රැස්වීම් කටයුතු ආදිය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ රැස්වීමට කලින්, යටත් පිරිසෙයින්, ලියවිල්ලකින් වූ දින හතක දැනුම්දීමක් එක් එක් සාමාජිකයා වෙත දිය යුතු ය.

(3) කමිටුවේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් අට දෙනකු විය යුතු ය.

(4) කමිටුවේ සියලු තීරණ, හැකි තරම් දුරට සමමතියක් මගින් ගනු ලැබිය යුතු ය.

(5) කමිටුවේ සෑම රැස්වීමකම රැස්වීම් කටයුතු වාර්තා පොතක සටහන් කරනු ලැබිය යුතු අතර ඒ වාර්තාවේ කමිටුවේ ඊළඟ රැස්වීමේ දී ස්ථිර කරනු ලැබිය යුතු ය.

(6) කමිටුව විසින්, මෙහි ඇතුළත් විධිවිධානවලට යටත්ව, ස්වකීය කාර්ය පරිපාටිය තීරණය කරනු ලැබිය හැකි ය.

20. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකින් හා අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ හා සභාවේ සාමාජිකයින්ට පාරිශ්‍රමික යන් ගෙවනු ලැබිය යුතු ය. මණ්ඩලයේ හා සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

21. මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු හෝ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සභාවේ සාමාජිකයකු, ස්වකීය විෂමාචාරය හෝ අශක්තුතාව හෝ අකාර්යක්ෂමතාව හේතුකොටගෙන ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට නුසුදුසු යයි, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ හෝ සභාවේ අනික් සාමාජිකයන්ගේ බහුතරයක් විසින් සලකනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ හෝ සභාවේ ඒ අනික් සාමාජිකයන්ගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින්, ඒ සාමාජිකයා ඉවත් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ හෝ සභාවේ පත් කළ සාමාජිකයන් ඉවත් කිරීම.

මණ්ඩලයේ හෝ සභාවේ සාමාජිකයන් විසින් සම්බන්ධතාව හෙළිදරව් කිරීම.

22. මණ්ඩලය විසින් සාදන ලද හෝ සාදනු ලැබීමට යෝජිත යම් ව්‍යාපෘතියක්, වෙළෙඳ ව්‍යාපාරයක් හෝ ගිවිසුමක් පිළිබඳව මූල්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයකින් කෙලින්ම හෝ අනියමින් හෝ සම්බන්ධතාවක් දක්වන මණ්ඩලයේ හෝ සභාවේ සාමාජිකයකු විසින් අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ හෝ සභාවේ රැස්වීමක දී හැකි කලින්ම වූ අවස්ථාවේ දී ස්වකීය සම්බන්ධතාවේ ස්වභාවය හෙළිදරව් කළ යුතු අතර, ඒ හෙළිදරව් කිරීම, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ හෝ සභාවේ වාර්තාවේ සටහන් කරනු ලැබිය යුතු ය. එම සාමාජිකයා විසින් ඊට පසුව, මණ්ඩලය විසින් හෝ සභාව විසින් අන්‍යාකාරයෙන් විධානය කරනු ලබන්නේ නම් මිස, ව්‍යාපෘතිය, වෙළෙඳ ව්‍යාපාරය හෝ ගිවිසුම සම්බන්ධයෙන් වූ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය.

සාමාජිකයන් අතර වූ පුරප්පාඩුවකින් මණ්ඩලයේ හෝ සභාවේ ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු බව.

23. මණ්ඩලයේ හෝ සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයන් අතුරෙන් යමෙකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් මණ්ඩලයේ හෝ සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල වේ යයි සලකනු නොලැබිය යුතු ය.

නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

24. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, යම් රජයේ නිලධරයකු, එම නිලධරයාගේ සහ එම නිලධරයා සේවයෙහි නියුක්ත වී හෝ අනුයුක්ත වී සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීම හෝ කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ යම් රජයේ නිලධරයකු, එම උපවගන්තිය යටතේ නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13(2) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ යම් රජයේ නිලධරයකු, එම උපවගන්තිය යටතේ නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13(3) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නියෝජ්‍යායතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

25. නියෝජ්‍යායතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

උපදේශකවරයන්.

**26.** මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ පූර්ව අනුඥාව ඇතිව, නියෝජ්‍යායතනයේ උපදේශකවරයන් වීමට හෝ අනුශාසකයන් වීමට නැතහොත් උපදේශකවරයන් වශයෙන් හෝ අනුශාසකයන් වශයෙන් ක්‍රියා කිරීම පිණිස ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක හෝ එහි යම් ශාඛාවක හෝ යම් රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ සහාය ලබා ගැනීම සහ අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් ගෙවීම කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයාට තොරතුරු සැපයීම.

**27.** නියෝජ්‍යායතනයේ කටයුතු හා මුදල් තත්ත්වය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල කැඳවනු ලබන තොරතුරු මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත සැපයිය යුතු ය:

එසේ වුවද, ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක් නොවන යම් පාර්ශ්වයක් සමග වූ යම් එකඟවීමක් යටතේ රහස්‍ය යයි සලකනු ලැබීමට නියෝජ්‍යායතනය බැඳී ඇති තොරතුරු සම්බන්ධයෙන් වූ තොරතුරු කිසිවක් මේ වගන්තිය යටතේ හෙළිදරව් නොකළ යුතු ය.

මණ්ඩලයට දෙනු ලබන අමාත්‍යවරයාගේ විධාන.

**28.** අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ ලිඛිත නිරීක්ෂණ ලබා ගැනීමෙන් පසු, ජාතික හිත පිණිස වූ කරුණු පිළිබඳව මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන මණ්ඩලය වෙත ලියවිල්ලකින් දිය හැකි අතර මණ්ඩලය විසින් ඒ විධාන බලාත්මක කළ යුතු ය.

නියෝජ්‍යායතනයේ අරමුදල.

**29.** (1) නියෝජ්‍යායතනය විසින් නියෝජ්‍යායතනයේ ම අරමුදලක් තබා ගැනීම හා පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.

(2) නියෝජ්‍යායතනයේ අරමුදලට—

(අ) නියෝජ්‍යායතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී නියෝජ්‍යායතනයට ලැබෙන සියලු මුදල්; සහ

(ඇ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, දේශීය හෝ විදේශීය කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් නියෝජ්‍යායතනයට ලැබිය හැකි සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී නියෝජ්‍යායතනය විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් නියෝජ්‍යායතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අරමුදලේ මුදල් ආපසු ගැනීම හා ආයෝජනය කිරීම.

**30.** අරමුදලින් යම් මුදල් ආපසු ගැනීමේ සහ අරමුදලේ යම් මුදලක් ආයෝජනය කිරීමේ පිළිවෙළ හා ආකාරය, තත් කාර්යය සඳහා කලින් කල සාදනු ලබන නියෝග අනුව මණ්ඩලය විසින් සකස් කරනු ලැබිය යුතු ය.

නියෝජ්‍යායතනය බදු ගෙවීම් ආදියෙන් නිදහස් කළ යුතු බව.

**31.** (1) (අ) නියෝජ්‍යායතනයේ ආදායම හෝ ලාභ හෝ වෙනත් ලැබීම් සම්බන්ධයෙන් යම් බද්දක් ; සහ

(ආ) නියෝජ්‍යායතනය විසින් හෝ නියෝජ්‍යායතනය වෙනුවට හෝ නියෝජ්‍යායතනය නමින් ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් පිළිබඳව යම් මුද්දර ගාස්තුවක්

ගෙවීමෙන් නියෝජ්‍යායතනය නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) නියෝජ්‍යායතනය වෙත පරිත්‍යාග කරනු ලැබූ හෝ නියෝජ්‍යායතනය විසින් එහි මුදල්වලින් ආනයනය කරනු ලැබූ නැතහොත් මිලට ගනු ලැබූ යම් භාණ්ඩ එසේ පරිත්‍යාග කරනු ලැබීම හෝ ආනයනය කිරීම නැතහොත් මිලට ගැනීම නියෝජ්‍යායතනයේ අරමුණුවල අභිවර්ධනය සඳහා හිතකර වන්නේ යයි සලකනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව එම භාණ්ඩ සම්බන්ධයෙන් යම් රේගු බද්දක් හෝ තීරු බද්දක් ගෙවීමෙන් නියෝජ්‍යායතනය නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) නියෝජ්‍යායතනය හා වෙනත් යම් පාර්ශ්වකරුවකු අතර වූ යම් එකඟවීමක අඩංගු වන්නා වූ ද, නියෝජ්‍යායතනය විසින් සලසන ලද හෝ සලසනු ලැබීමට ඇති සේවාවන් සම්බන්ධයෙන් හෝ නියෝජ්‍යායතනයේ වැඩ සඳහා ආධාරයක් වශයෙන් අන්‍ය කාරයකින් හෝ නියෝජ්‍යායතනයට ගෙවීම සඳහා විධිවිධාන සලස්වා තිබෙන්නා වූ ද යම් සාධන පත්‍රයක් ඇති අවස්ථාවක, නියෝජ්‍යායතනය හා ඒ අනෙක් පාර්ශ්වකරු යන උභය පාර්ශ්ව යම, ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් යම් මුද්දර ගාස්තුවක් ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

(4) සලසන ලද සේවාවන් සඳහා නියෝජ්‍යායතනයට ගෙවීමක් කරන්නා වූ හෝ නියෝජ්‍යායතනයේ සාමාන්‍ය ආධාරය සඳහා දායකවීමක් වශයෙන් නියෝජ්‍යායතනයට ගෙවීමක් කරන්නා වූ හෝ යම් තැනැත්තකු විසින්, ආදායම් බදු ගෙවීමට යටත් වන ප්‍රමාණය ආගණනය කිරීමේ කාර්යය සඳහා, නියත වශයෙන්ම ඒ ගෙවීම කරන ලද වර්ෂයේ ආදායමෙන් අඩු කිරීමක් වශයෙන් ඒ ගෙවන ලද මුදල් ප්‍රමාණයට හිමිකම් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

නියෝජ්‍යායතනයේ මුදල් වර්ෂය හා ගිණුම් විගණනය.

**32.** (1) නියෝජ්‍යායතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) නියෝජ්‍යායතනයේ ආදායම හා වියදම, වත්කම් හා ණය තුරුස් සහ වෙනත් සියලු ගනු දෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය.

(3) නියෝජ්‍යායතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

අරමුදලට ආදායමක් ලබා දීම සඳහා විශේෂ අපනයන තීරු බදු.

**33.** (1) පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් කලින් කල නීරණය කරනු ලබන මුදලක් මගින් අපනයන තීරු බද්දක්, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන ජලජ නිෂ්පාදිතයන් සම්බන්ධයෙන් අය කිරීම, ලබා ගැනීම හා ගෙවීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන යම් යෝජනා සම්මතයක්, එවැනි ම වූ යෝජනා සම්මතයක් මගින් කවර වූ හෝ අවස්ථාවක වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(3) මේ වගන්තිය රේගු බදු ආඥාපනතේ කොටසක් වූවාක් මෙන් එය බලාත්මක වන අතර එම ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය:

එසේ වුව ද, මේ පනතින් පනවනු ලබන අපනයන තීරු බදු, එම ආඥාපනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පනවනු ලැබූ යම් අපනයන තීරු බද්දකට අතිරේකව විය යුතු ය.

(4) මේ පනත මගින් පනවනු ලබන අපනයන තීරු බදු මගින් රැස් කෙරෙන මුදල් ප්‍රධාන රේගු අයකැමි විසින් නියෝජ්‍යායතනය වෙත මාසිකව ගෙවිය යුතු අතර ඒ මුදල නියෝජ්‍යායතනයේ අරමුදලට බැර කළ යුතු ය.

වාර්තා.

**34.** නියෝජ්‍යායතනයේ නිලධරයන් විසින් පවත්වන ලද පර්යේෂණ, අධ්‍යයන, පරීක්ෂණ, අත්හදා බැලීම් හා වෙනත් විමර්ශන සහ ඔවුන්ගේ ගවේෂණ හා සොයා ගැනීම් පිළිබඳ විස්තර අඩංගු වාර්තා පවත්වා ගෙන යනු ලැබීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා සැලැස්විය යුතු ය.

චංචල හා නිශ්චල යන උභය අංශයේ රජයේ දේපළ නියෝජ්‍යායතනයට ලබා දිය යුතු බව.

**35.** අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, නියෝජ්‍යායතනයේ කාර්ය සඳහා යම් චංචල හෝ නිශ්චල රජයේ දේපළක සන්තකය හා පාවිච්චිය නියෝජ්‍යායතනය වෙත පැවරීම හා සතු කිරීම කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ, රජයේ යම් නිශ්චල දේපළකට බලපාන කිසිම නියමයක් ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, නොසෑදිය යුතු ය:

එසේ ම තවදුරටත්, අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ, රජයේ යම් චංචල දේපළකට බලපාන කිසිම නියමයක් ඒ දේපළ පාලනය කරනු ලබන අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව නොසෑදිය යුතු ය.

ඇතැම් පර්යේෂණ යෝජනා ක්‍රම නියෝජ්‍යායතනයට පැවරීම.

36. නියමිත දිනට පසුව හැකි ඉක්මණින්, නියෝජ්‍යායතනයට පවරන ලැබිය යුතු යයි අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන, යම් අංශයක් විසින් හෝ අමාත්‍යවරයා යටතේ වූ යම් රාජ්‍ය සංස්ථාවක් විසින් නැතහොත් ඒ අංශය හෝ සංස්ථාව සඳහා හෝ ඒ අංශය හෝ සංස්ථාව වෙනුවට වෙනත් යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන පර්යේෂණ යෝජනා ක්‍රම සියල්ල හෝ ඒවා අතුරෙන් කිසිවක්, මෙහෙයවීමේ, ඒවාට ආධාර කිරීමේ හා ඒවා දිගටම පවත්වාගෙන යාමේ වගකීම නියෝජ්‍යායතනය විසින් භාර ගනු ලැබිය යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

37. (1) නියෝජ්‍යායතනයේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගනු ලැබිය යුතු බවට නියමිතව ඇති සහ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලබන අවස්ථාවක, එම දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍යව ඇති බවට සලකනු ලැබිය යුතු අතර එය ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබ නියෝජ්‍යායතනය වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නියෝජ්‍යායතනය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් නියෝජ්‍යායතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ නියෝජ්‍යායතනයේ විධානය අනුව කරන ලද ක්‍රියාවක් පිළිබඳ ආරක්ෂාව.

38. (1) කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක්—

(අ) මේ පනත යටතේ නියෝජ්‍යායතනය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නියෝජ්‍යායතනයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ නියෝජ්‍යායතනයේ විධානය අනුව නියෝජ්‍යායතනයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, නියෝජ්‍යායතනයේ ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

පවරනු නො ලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ නියෝජ්‍යායතනය විසින් හෝ නියෝජ්‍යායතනයට විරුද්ධව ගෙනෙනු ලැබූ යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් නියෝජ්‍යායතනය විසින් දරනු ලැබූ යම් වියදමක් නියෝජ්‍යායතනයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් නියෝජ්‍යායතනය වෙත ගෙවනු ලබන හෝ නියෝජ්‍යායතනය විසින් අය කර ගනු ලබන යම් ගාස්තු නියෝජ්‍යායතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ නියෝජ්‍යායතනයේ විධානය අනුව කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව ගෙනෙනු ලැබූ යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන

ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය තීරණය කළහොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී අය කර ගනු ලැබුවේ නම් මිස, නියෝජ්‍යායතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**39.** නියෝජ්‍යායතනයේ කිසිම නිලධරයකු හෝ සේවකයකු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා හා මණ්ඩලය යන උභය පක්ෂයේම පූර්ව කැමැත්ත ලියවිල්ලකින් ලබා නොගෙන වෙනත් යම් සේවායෝජකයකු සඳහා වැටුප් සහිත සේවයක නිරත නොවිය යුතු ය. *කිසිම නිලධරයකුට හෝ සේවකයකුට වෙනත් යම් සේවායෝජකයකුගේ සේවයෙහි නිරත විය නොහැකි බව.*

**40.** (1) අමාත්‍යවරයා විසින්, මණ්ඩලය විමසා, මේ පනත යටතේ නියෝග සාදනු ලැබීමට බලය දී ඇත්තේ හෝ නියමිතව ඇත්තේ යම් කරුණු සම්බන්ධයෙන් ද ඒ සියලු කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය. *නියෝග.*

(2) මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම පළ කරනු ලැබූ දිනට පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**41.** (1) මණ්ඩලය විසින්, මේ පනත මගින් රීති සාදනු ලැබීමට බලය දී ඇත්තේ හෝ නියමිතව ඇත්තේ යම් කරුණු සම්බන්ධයෙන් ද, ඒ කරුණු සියල්ල හෝ ඒ අතුරෙන් යම් කරුණක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය. *රීති.*

(2) මණ්ඩලය විසින්, (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමතය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක්, එය බලාත්මක නොවිය යුතු ය.

**42.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— *අර්ථ නිරූපණය.*

"අක් වෙරළ ප්‍රදේශ" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රිය කලාප පිළිබඳ පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍යයට, අධිකරණ බලසීමාවට හෝ පාලනයට යටත් සියලු ප්‍රදේශ අදහස් වේ;

"ජලජ නිෂ්පාදිතයන්" යන්නෙන්, ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත ජල මාධ්‍යය තුළින් හෝ ඊට යටින් ගනු ලැබූ පිරිසැකසුම් කළ හෝ පිරිසැකසුම් නොකළ යම් ජලජ සම්පතක් හෝ ද්‍රව්‍යයක් අදහස් වේ;

"ජලජ සම්පත්" යන්නෙන්, ජල මාධ්‍යයෙහි අඩංගු හෝ ජල මාධ්‍යයට යටින් ඇති සියලු සජීවී හා අජීවී සම්පත් අදහස් වේ;

"ජාතික ජලජ සම්පත්" යන්නෙන්, ජල මාධ්‍යයෙහි අඩංගු හෝ ජල මාධ්‍යයට යට තිබී සොයා ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍යයට, අධිකරණ බලසීමාවට හෝ පාලනයට යටත් වන්නා වූ ද සියලු සජීවී හා අජීවී සම්පත් අදහස් වේ;

"අභ්‍යන්තර ජල ප්‍රදේශ" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රිය කලාප පිළිබඳ පනත යටතේ අදාළ වන්නා වූ පාදරේඛාවල ගොඩබිම පැත්තේ පිහිටා ඇති සියලු ජල ප්‍රදේශ අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක්, ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"ලංකා ධීවර සංස්ථාව" යන්නෙන්, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ලංකා ධීවර සංස්ථාව අදහස් වේ;

"ලංකා ධීවර වරාය සංස්ථාව" යන්නෙන්, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ලංකා ධීවර වරාය සංස්ථාව අදහස් වේ;

"වෙරළබඩ තෙත් බිම්" යන්නෙන්, වෙරළබඩ ලුණු වතුර, වෙරළ බඩ පිරිසිදු ජලය, වගුරු බිම් සහ මෝයවල්, කලපු හා කඩොල් මඩ වගුරු ඇතුළු මඩ තට්ටු අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.